# Living the LOTUS

Buddhism in Everyday Life

3
2019

VOL. 162




## Founder's Essay

# සතුට හා අසතුට, කාසියක දෙපැත්ත මෙනි

රැකියාවේ උසස්වීම් හා ස්ථාන මාරු සිදුවන අවස්ථා වල, උසස්වීම් වලට තේරී පත්වූ අය මහත් උද්යෝගයෙන් සිටින විට, උසස්වීම් නොලද අය 'ආයතනය විසින් මගේ රාජකාරිය ඇගයීමට ලක් කරන්නේ නැහැ' කියා බලපොරොත්තු අත්හැර ගනියි.

අපි නිතරම 'සතුටු දේ' හා 'අසතුටූ දේ' ලෙස කරුණු කාරන කොටස් 2 කට වෙන් කරයි. තම සිතැඟි ආකාරයට ඉටු නොවන අසතුටු දේවල් ප්‍රතික්ෂේප කර, සතුටු දැනෙන කැමතිදේ පමණක් භාරගනී. එබැවින් සතුට හා අසතුට යනු, හරියට කාසියක දෙපැත්තක් සේය.

වැසි වැටුනත්, ඉන් පසු ඉර පායා පැහැබර දවසක් උදාවේ. එසේම, පැහැබර දවස් ගෙවී ගොස් නැවතත් වැසි දිනයන් උදාවේ. හොඳින් ඉර පෑයූ විට ආනන්දනීය සුවයක් ගෙනදෙනවා සේම, සීතල ඇති විට ශරිරය වෙවුලයි. ශීත කාලයේ රැස් කර ගන්නා ශරීර ශක්තිය, හිතේ හැටියට ඔපමට්ටම් කර ගත හැකි වසන්ත කාලය අනිවාර්යයෙන් ළඟා වේ.

උසස් වීම් අපට ලැබෙන්නාවූ විශේෂ අවස්ථාවක් නම්, පහතට වැටීමද අපට ලැබෙන්නාවූ විශේෂ අවස්ථාවකි. එම අවස්ථාවන් කුමන දිශානතියකට ගෙන ගනවාද යන්න තීරණය වන්නේ, අපගේ සිතුවිලි වලිනි. එබැවින් 'මේ මොහොතේ තමා සිටින ස්ථානය, ධර්ම පුහුණුවට හොඳම ස්ථානය' බව අධිෂ්ඨාන කරගත් විට, ඒ සැනින් එහි ප්‍රතිඵල දකින්නට ලැබේවි.

*Kaiso zuikan* 9 පි. 40-41


**Living the Lotus**
**Vol. 162 (March 2019)**

Senior Editor: Koichi Saito
Editor: Eriko Kanao
Copy Editor: P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,


Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

## President's Message

# තම සතුටත්, අන්‍යයන්ගේ සතුටත් පතන හදවත



නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

### අප 'බුදුහිමියන්ගේ දරුවන්' වන බැවින්

අපි කවුරුන් වුවද, හැමෝම ප්‍රාර්ථනා කරන්නේ, තමනුත්, තම පවුලේ සියළුදෙනාත් සතුටින් සිටිනු දකින්නටයි. එසේම අන්‍යයන්ගේ සතුට, සොම්නස ප්‍රාර්ථනා කරන හදවතද අප හැමදෙනාටම තිබේ.

විවිධාර්ථ සූත්‍රයේ තෙවන පරිච්ඡේදය වන 'දශ පුණ්‍යයෝ' හි, 'පින්වත් දරුවනි, ඔබලා දැන් සැබෑ ලෙසින් බුද්ධ පුත්‍රයෝ වන්නාහ. ඔබලාගේ මහා මෛත්‍රිය හා කරුණා බලයෙන් දැඩි දුකෙහි ගැලී සිටින අසරණ සත්වයන්ට විමුක්තිය සලසන්නට සමත් වන්නේය' ලෙස සඳහන් වේ. එනම්, අපගේ 'මහා මෛත්‍රිය හා කරුණා බලයෙන් දැඩි දුකෙහි ගැලී සිටින මනුෂ්‍යයන්ගේ දුක් වේදනා නිවමින්, ව්‍යසන වලින් මුදවා ගැනීමට හැකිවේ'. ඔබලා එය අවබෝධ කර ගෙන සිටිත්ද?

මෙම පාඨය පටන් ගන්නේ, ' 'පින්වත් දරුවනි, ඔබලා දැන් සැබෑ ලෙසින් බුද්ධ පුත්‍රයෝ වන්නාහ.' ලෙසිනි. වෙනත් අයුරකින් පවසනවා නම්, 'බුද්ධ පුත්‍රයන් වන නිසා, මිනිසුන්ගේ දුක් වේදනාවන් නිවාලමින්, ව්‍යසන වලින් මුදවාගනිමින්, සන්සුන් හැඟීමට පත්කළ හැකිවේ' යන්නයි.

එබැවින්, අපි 'බුද්ධ පුත්‍රයන්' වන බව අවබෝධ කරගෙන සිටිත්ද, නැතිද යන්න වැදගත් වුවත්, සත්‍යය වශයෙන්ම එම කරුණ අවබෝධ කරගෙන අන්‍යයන් සමඟ කටයුතු කරන පිරිස අත්ලොස්සක් වේ.

උදහරණයක් ලෙස, 'අපගේ ජීවිතය අනිත්‍ය හා අනාත්ම ය' ලෙස අවබෝධ කර ගන්නා පුද්ගලයන් 'බුද්ධ පුත්‍රයෝ' වේ යැයි සිතමි. ත්‍රි ලක්ෂණය වන 'අනිත්‍ය, අනාත්ම හා නිර්වාණ සුවය' පිළිබඳ තමා විසින්ම අවබෝධ කර ගෙන හෝ වෙනත් අයෙකුගෙන් අසා දැනගෙන, 'මෙය සම්පූර්ණ සත්‍යයකි' සේ හදවතට බද්ධ වන්නේ 'බුද්ධ පුත්‍රයෙකු' වන නිසාය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ උපුටා ගත් පාඨයක, 'ප්‍රථම ලෝකෝත්තර ඥානය පහළ වන මොහොත, සත්‍යාවබෝධයට පත්වන වේලාවයි' සේ සඳහන් වේ. මෙම ධර්ම පාඨයන් පැහැදිලි වන්නේ, 'බුදුන් වහසේගේ ධර්මයේ දොරටුව ළඟ සිටගන්නේද, එම තැනැත්තා බුදුන් වහන්සේගේ ධර්මයේ කොටසක් ග්‍රහණය කර ගෙන ඇත' යනුවෙනි. එබැවින්, සුළුවෙන් හෝ 'සෑම දෙයකම වෙනස්වීමේ ස්වභාවය නොනවත්වා සිදුවේ', 'සෑම දෙයක්ම බුද්ධ ශක්තියෙන් යුතුව සමානාත්මතාවයෙන් පිරී ඇත' ලෙස තේරුම් ගන්නේ නම්, එය 'බුද්ධ පුත්‍රයෙකු' වීමේ අවබෝධයයි. එම තැනැත්තන් තමන්ගේ සතුට හා සුවය ප්‍රාර්ථනා කරන්නාසේම, අන්‍යයන්ගේ සතුට හා සුවය ප්‍රාර්ථනා කරමින්, තම වටපිටාවට සතුට ගෙනෙන බෝධිසත්වයන් වේ.

## ජීවමාන සූත්‍රයක් බවට පත්වීම

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 'නව සාමාජිකයන්ද ධර්ම ව්‍යාප්තිකයන් වේ' ලෙස පවසයි. සාමාන්‍යයෙන් අප සිතන්නේ, ඉතාම මෑතකදී සංවිධානයට එක්ව ධර්මය ඉගෙනගත් කෝඩුකාරයන්ට අන් අය ධර්මය කියා දීමට අපොහොසත් වෙයි ලෙසය. නමුත් දශ පුණ්‍යයෝ වන 3 වන පරිච්ඡේදයේ 'තමාට මායාවෙන් නිදහස් වන්නට බැරි වුවද, ධර්මය අසා අන්‍යයන්ව දුකින් මුදවා ගැනීමට හැකිවේ' ලෙස පැහැදිලිවම සඳහන් වේ.

උදාහණයක් ලෙස, තම මිත්‍රයෙකු කෙරෙහි දැඩි කෝපයෙන් සිටි තැනැත්තෙකු, ධර්මයට සවන් දී 'කෝපය ඇතිවුවේ, මගේ සිතුවිලි වලට අනුකූලව මිත්‍රයා කටයුතු කල යුතුයි යන ආත්මාර්ථකාමිත්වය නිසාය' ලෙස පසු විපරම් කරයි. ඒ තුලින් මිත්‍රයා සමඟ නැවතත් යහපත් බැඳීමක් ඇතිවේ. ඉන් පසු වෙනත් පුද්ගලයෙකු කෝපයෙන් වෛරයෙන් සිටින අවස්ථාවල, තමා කෝපයෙන් නිදහස් වූ ආකාරය පැවසූ විට, එම තැනැත්තා 'මමත් ඒ ආකාරයෙන් දැක්මක් ජීවිතයට බද්ධ කරගෙන, හැඟීම් සැහැල්ලුවට පත් කරගෙන සතුටට පත් වෙන්නට ඕනේ' යන හැඟීම ඇති කිරීමේ ශක්තිය එහි ඇත.

මන්දයත්, තමා කෝඩුකාරයෙක් වුවත් ධර්මය, විශ්වයේ යථාර්තය හා බද්ධ වී සිටින බැවිනි.

එබැවින් ධර්මය ශ්‍රවණය කිරීමෙන් ඔබ අවබෝධ කරගත් දේ, ලැබූ ආදර්ශ හා ආභාසය අව්‍යාජව අන් අයට පැවසීමෙන් 'මමත් මේ ආකාරයට දීප්තිමත්, අවංක හදවතින් එදිනෙදා ජීවිතය ගත කරන්නට ඕනේ' යන ප්‍රාර්ථනය හා 'දුකින් පීඩාවට පත් වූ පුද්ගලයන්ට සමීපව, සතුට බෙදාගැනීමට ඕනේ' යන පරාර්ථකාමී හදවතක් ඇතිවේ.

තවද, දශ පුණ්‍යයෝ හි 3 පරිච්ඡේදයේ 'මනුෂ්‍යයන් බෝධිසත්ව චර්යයාවේ යෙදෙන්නේ කොතැනද, එතැන ධර්මය පවතී' සේ සඳහන්ය. සතුටින් සොම්නසින් ජීවත්වන අපගේ ස්වරූපයෙන්, දුකින් පීඩාවට පත් වූ පුද්ගලයන්ගේ හදවතට සත්‍යයේ ආලෝකය දල්වා යහපත් ජීවිතයකට මඟ පෙන්වයි. 'සියළු සත්වයන්ට ඔබලා පුණ්‍ය ක්ෂේත්‍රයෝය' ලෙසින් සතුට සොම්නස ලබාදෙන කෙනෙකු බවට පත්වීමට හැකිවේ.

නිතරම, කා හටත් 'දීප්තිමත්, කාරුණික, උණුසුම්' ස්වරූපය කිසිකලෙක අමතක නොකළ යුතු වේ. සූත්‍ර පොත දක්ෂ ලෙස පැහැදිලි කිරීමට නොහැකි වූවත්, අන් අය ගැන නිතරම සිතමින් කටයුතු කරන පුද්ගලයන්, තමාටත් අන්‍යයන්ටත් සතුට ගෙන දෙන 'ජීවමාන සූත්‍රයක් ' වැනිය.

From Kosei, March 2019.

# Spiritual Journey

## ධර්මයට සමීප කළ සුහද හමුවීම්

ශ්‍රී ලංකා ශාඛාව
සුනන්ද තිලකරත්න

මෙම සෙප්පෝව ඉදිරිපත් කලේ, 2018 වසරේ සැප්තැම්බර් මස ශ්‍රී ලංකා ශාඛාවේ 20 වන සංවත්සරය වෙනුවෙනි.

මම සුනන්ද තිලකරත්න. වයස අවුරුදු 58 යි. මම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට එකතු වී වසර 20 ක කාලයක්, එය තමයි මගේ ජීවිතයේ විශිෂ්ටතම කාල පරිච්ඡේදය. මගේ ජීවිතය ගැන හැරී බැලුවිට, මාව ධර්මයට සමීප කළ සුහද හමුවීම් ලෙස චරිත තුනක් තිබෙනවා.

ප්‍රථමයෙන්ම මතකයට නැගෙන්නේ, මගේ අම්මාගේ හැඩරුවයි. සෑම මනුෂයෙකුටම ප්‍රථම මතකයන් ලෙස සිහිපත් කරගත හැක්කේ තමන්ගේ අම්මා කියලයි මම විශ්වාස කරන්නේ. වයස අවු 13 ක් පමණ වන තෙක් එක් දිනක් හෝ අම්මාව නොදැක ජීවත්වීමේ හැකියාවක් මට තිබුණේ නැහැ.

ඊළඟට මතකයට එක්වන්නේ මගේ තාත්තාවයි. මට අවු 3 ක් පමණ වන විට තාත්තා පුංචි ලී අශ්වයෙකු හා රෝද තුනේ සයිකලයක් ගෙනත් දුන්නා. මා නිදාගන්නා විට අම්මා කිවූ නැලවිලි ගී මතකයේ නොමැති වුවත්, තාත්තා සෙල්ලම් අශ්වයා පද්දමින් ගායනා කළ හින්දි ගී කොටස් තවමත් මගේ මතකයේ රැව් දෙනවා.

මගේ මව්පියන්ට පසුව හදවතේ තැන්පත් වූ අනෙක් තැනැත්තා ගැන පවසන්නම්. 1963 වෙසක් පුන් පොහෝ දින උදේ නැගිටිනකොට මගේ පුංචි ගෙය හරිම ලස්සනට සරසලා තිබුණා. එය ගෙයක් ලෙස



ශ්‍රී ලංකා ශාඛාවේදී සෙප්පෝව ඉදිරිපත් කරන සුනන්ද මහතා

යොදා ගත්තද එදා අපි ජීවත් වුනේ තාත්තාගේ ව්‍යාපාර ගොඩනැගිල්ලේම පිටුපස කාමරයේ යි. ගේ ඇතුළ වගේම ව්‍යාපාරික ස්ථානයේත් පාට පාට ලස්සන සව් කඩදාසි වලින් සරසලා, කඩේ දොර ළඟට මාව වඩාගෙන ගිහින් තාත්තා නිර්මාණය කරපු පුංචි තොරණක් පෙන්නුවා. ඒ තොරණ මැද්දෙ ලස්සන පියකරු රූපයක් තිබුනා. තාත්තා කියපු විදිහට එයාව සිහිපත් කරවන්නයි, ගරු කරන්නයි තමයි ගේ සරසලා තිබුණේ. එදා මම දැනගත්තා අම්මාටයි තාත්තාටයි වැඩිය ලොකු තවත් කෙනෙක් මේ ලෝකය තුළ සිටින බව.

හැන්දෑවට මල් පහන් පත්තු කරලා ගේ පුරාම සුවඳ දුම් අල්ලලා ගාථා කියමින් වන්දනා කරන්නේ එම විශිෂ්ටතම තැනැත්තා වූ බුදුන් වහන්සේට බව එදා මම දැනගත්තා. එදා සිට මමත් අම්මා සමඟ බුදුන් වැන්දා. අම්මා තාත්තා වගේම බුදුන් වහන්සේත් මගේ ලෝකය වුණා.

මම පුංචි කාලයේ අම්මාගෙන් තාත්තාගෙන් ඉල්ලා නොලැබෙන දේවල්, බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියා. සෑම වසරකම මා ආශාවෙන් වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය උදාවෙන තෙක් බලා සිටියා. ඒ මුළු රටම ඉතාමත් ලස්සනට බැබලෙන දිනය වන නිසා.

මට වයස අවුරුදු 10 සිට විවාහ දිවියට පත් වූ පසුත්, දරුවන් වෙනුවෙත් මම වෙසක් කුඩු නිර්මාණනය කළා. එදා වෙසක් කුඩු වැස්සට තෙමී ඉරී යන කොට මම බුදුන් වහන්සේ සමඟ අමනාප වුණා.

රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ සාමාජිකයෙක් වීමට පෙර සිටම බුදුන් වහන්සේට බෙහෙවින්ම සමීපව කටයුතු කළා. පන්සලේ පිංකම්, පෙරහැර සංවිධානය කිරීම වගේම විහාරස්ථානයේ දායක සභාවේ ලේකම්වරයා ලෙස තරුණ අවදියේදී මා කටයුතු කළා. නිවසේත් ව්‍යාපාර ස්ථානයේත් නොවරදවාම බුදුන් වන්දනා කිරීම සිදු කළා.

1996 වෙසක් මාසයේ අමතක නොවන දිනයක් උදා වුනා. ඒ මගේ ව්‍යාපාරය ගිනි ගැනීමෙන් ගොඩනැගිල්ලට සම්පූර්ණ අලාභ හානි වුණා. ආර්ථික ආගාධයක් මා ඉදිරියේ දිස් වුණා. මේ ගිනි ගැනීමට හේතුව වූයේ සේවකයෙකු බුදු පහණ දල්වා ඉන් බැහැර වූ අවස්ථාවේ, ඔහු විසින් ඉවත දමන ලද ගිනි කූර ඇවිලීමෙනි.

එදා මා කම්පාවට පත් වූයේ බුදුන් නිසාම ගොඩනැගිල්ල විනාශ වී බුදුන් වහන්සේ පිහිට නොවූ නිසාවෙන්ය. එදා මම බුදුන් වහන්සේ සමඟ අමනාප වුණා. බුදුන් වැඳීමත් පන්සල් යාමත් නැවැත්තුවා. පොදු අවස්ථාවලදී අනෙක් අය පන්සිල් ගනිද්දි මම දෑත් බැඳ බලා සිටියා.

එයින් මාස 6 ක් පමණ කාලයක් ඉතාම අසහනකාරී ජීවිතගත් ගත කල මට, මස්සිනා වූ මහේෂ් රුද්‍රිගුගේ මිතුරෙකු වූ ගාමිණී චන්ද්‍රසේකර මහතාව හඳුනාගැනීමට හැකි විය. ඔහු කතා කරන සෑම අවස්ථාවකම ජපාන සංවිධානයක් ගැන විස්තර කර, එහි අගය පැහැදිලි කළේය. එක්තරා දිනක මෙම සංවිධානයේ උත්සවයකට අප පවුලේ සියලුම දෙනාට ආරාධනා ලැබ, සහභාගි විය.

එම සංවිධානය රිෂ්ෂෝ කෝසෙයි නම් විය. එදින ආගමික පූජා උත්සවය ඉතාමත් ආකර්ශනීය ලෙස සංවිධානය කර තිබුණ අතර එම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ජපානයෙන් පැමිණි මසතොසි ශිමමුරා මහතාගේ හැසිරීම රටාව හා එතුමා කළ දේශනයට ආකර්ශනය වී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ සාමාජිකයෙකු වීමට තීරණය කලා. අදත් මා ඉතාමත් ගෞරවයෙන් එතුමාව සිහිපත් කරනවා. එයින් පසු මගෙන් ඈත් වී සිටි බුදුන් වහන්සේ ටිකින් ටික මගේ හදවත තුල නැවත වතාවක් ලැගුම් ගත්තා.

පෙර ධර්ම මන්දිරය පැවති දෙහිවල හා මා ජීවත්ව සිටි වත්තල, සමීපතම ප්‍රදේශයක් බවට පත් වු අතර, ධර්ම ව්‍යාප්ත කටයුතු වලට සහය දී කටයුතු කලහ. ඉන් බුදු දහම පිළිබඳ තවදුරටත් ඉගෙන ගැනීමත්, තායිලන්තයේ හා ජපානයේ පැවති ධර්ම සම්මන්ත්‍රණවලට සහභාගි වීමට හා ධර්මාචාර්යවරයෙකු ලෙස ඉගෙන ගැනීම තුළින් දිනෙන් දින බුදුන් වහන්සේට තව තවත් සමීප වීමේ හැකියාව ලැබුණි. සාමාජිකයින් පනහකට වැඩි පිරිසක් සංවිධානයට හඳුන්වා දීමට මා සමත් වූ අතර, ඒ අතරින් ධර්ම නායක පර්සි විජේරත්න මහතාව හඳුන්වා දීම පිළිබඳව මා බෙහෙවින් සතුටට පත් වෙමි.

වසර 20 ක මෙම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය ජීවිත කාලය තුල සතුට, දැනුම, කරුණාව මෙන්ම කණගාටුව හා කළකිරීමට පත්ව සංවිධානයේ ඉවත්ව යාමට උත්සාහ කළ අවස්ථාද තිබුණි.

සංවිධානයේ ඉගැන්වීම් ගැන නිවැරදි අවබෝධයක් නොමැති සාමාජිකයන් තුල නොයෙකුත් වාද බේද හැල හැප්පීම් හා පිල් බෙදීම් නොඅඩුව පැවතුණි. මෙවැනි අර්බුදකාරී තත්වයක් තුළදී අප ශාඛා ප්‍රධානී ලෙස යමමොතෝ මැතිතුමාගේ පැමිණීම ආශිර්වාදයක් විය.

නමුත් සාමාජිකයින්ටත් වඩා වැඩි කම්කටොලු රාශියක් එතුමා හමුවේ විය. එම කලකෝලහාල අභිමුවේ නිසොල්මන්ව බලා සිටි එතුමා, කරුණාව හා මෛත්‍රී උපදවා අප සියල්ලන්ගේම හදවත් තුළ බෝධිසත්ව ගුණයක් රෝපණය කිරීමට සමත්විය.

යමමොතෝ ශාඛා ප්‍රධානී තුමා ශ්‍රී ලංකාවේ සියලු සාමාජිකයන්ගේ විශ්වාසය ලබා ගත්තේය. එතුමාගේ බිරිද කයෝ මහත්මියගේ ආගමනයද අපට ශක්තියක් විය. අප බලාපොරොත්තුවෙන් සිටි ධර්ම මන්දිරයද එතුමාගේ ආශිර්වාදයෙන් ගොඩනැංවීමට මුලස්ථානයෙන් උදව් උපකාරද ලැබුනි. අපගේ ශ්‍රී ලංකා ශාඛාව පිළිබඳව අද මා බෙහෙවින් සතුටු වෙමි.

සංවිධානයේ සාමාජිකයන්ගේ කරුණා දයාව පිළිබඳ කථාකිරීමේදී එක්තරා සිද්ධියක් සිහිපත් කරමි. ඒ මීට මාස කිහිපයකට පෙර මගේ මව ධර්ම මන්දිරයේ පොහොය වැඩසටහනකට සහභාගි වූ අවස්ථාවක අසනීප වී ඇත. එවිට සාමාන්‍යයෙන් කරනුයේ අසනීප වු තැනැත්තාව ගෙදරට ගෙනත් ඇරලවීම වුවද, සාමාජිකයන් එසේ නොකර අවශ්‍ය ප්‍රථිකාර ලබාදී, ඇයව පොහොය වැඩසටහන කෙරුණු ස්ථානයේම සුවපහසු ලෙස මෙට්ටටයක් දමා වැතිර ගෙන හෝ ඇය ප්‍රිය කළ එම ධර්ම වැඩසටහනට සහභාගි වීමට ඉඩ සලස්වා තිබුනි.

එදින ප්‍රමාද වී වැඩසටහනට පැමිණි මට එම දර්ශනය දැකීමෙන් මෙතරම් උත්තරීතර සංවිධානයක් සේම, මෙතරම් උත්තරීතර සහෝදර සාමාජිකයන් පිරිසක් සමඟ කාලය ගත කිරීමට අවස්ථා ලැබීම ගැන බෙහෙවින් සතුටට පත් වුවෙමි.

අම්මාගේ ජිවිත කාලය තුලදී, නිතරම පන්සල් වැදගත්කොට සලකමින්, හාමුදුරුවන් වහන්සේලා රාශියකගෙන් ධර්මය ශ්‍රවණය කර තිබුණි. ඒත්, මීට වසර 10 කට පෙර පියාගේ අවමංගල්‍ය උත්සවයට අම්මාගේ ඥාතින් බෙම්මුල්ල ගම්මානයෙන් පැමිණ සිටියේ නැත. එයින් කළකිරීමට පත්ව ජීවිත කාලය තුළදී ගමට නොයාමට තීරණය කර සිටියාය. ඒ වන විට මමත් කෝසෙයි සංවිධානයේ සාමාජිකයෙකු වූවත්, අම්මාගේ හැඟීම් වැදගත්කොට සලකා ගමට ගියේ නැහැ.

අම්මා මියයාමට දින 10 කට පෙර, ඥාතීන් ගැන නොසතුටින් සිටින අම්මා වෙනුවෙන් කුමක් හෝ කළ යුතුයි සිතා, සද්ධර්ම පුණ්ඩරීක සූතයේ 'දේවදත්ත පරිච්ඡේදය' ගැන පැහැදිලි කලහ. මම හදවතට එකඟව පැහැදිලි කළ ධර්ම කරුණු අම්මාට අවබෝධ විය. ඊට දින

කිහිපයකට පසුව මමත් අම්මාත් පවුලේ අයත් කිසිදා නොයාමට සිතූ බෙම්මුල්ල ගමට ගොස් ඥාතීන් සමඟ සතුටු වුණෙමි. අවසාන සතිය තුළදී බෝධිසත්ව ගුණයන් වලින් අම්මාගේ හදවත පුරවා ලීමේ හැකියාව මා සතු විය. ඥාතීන් සමඟ නැවතත් මිත්‍ර වීමට හැකිවීම, එය ලබන ආත්මය වෙනුවෙන් අම්මා ලබාගත් විශාල ආනිශංස යැයි සිතමි.

අවසාන මරණ මංචකයේදී අවසාන කථා බහේදී ඇයට හුස්ම ගැනීමට උපකාර වූ උපකරණයද විහාරස්ථානයේ නායක ස්වාමින් වහන්සේට පූජා කරමින්, අවසන් ගමන යාමේ වාසනාව ඇයට හිමිවුයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සඳහන් ආකාරයට බෝධිසත්ව ජීවිතයක් ගත කරමිනි.

කෝසෙයි සංවිධානයේ කියාදීම් වලින්, මාගේ ජීවිතයේ කොපමණ ප්‍ර ශ්න ගැටළු පැමිණියද බුදුන් වහන්සේගේ ධර්මයට අනුකූලව ඒ හැම ගැටළුවකටම මුහුණදෙමින් කටයුතු කිරීමට සිතා ගත්තා. කොපමණ ප්‍ර ශ්නකාරී තත්වයක වුවද, බුදුන් වහන්සේගේ ආශිර්වාදය නිතරම ලැබුණා වාගේම, බුදුන් වහන්සේ විසින් නොයෙකුත් පුද්ගලයන් මා වෙනුවෙන් මෙහෙයවනු ලැබුවා.

අවසානයට රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය ලංකාවට හදුන්වා දුන් ගාමිණී චන්ද්‍රසේකර මහතාටත්, එතුමාව මට හදුන්වා දුන් මහේෂ් රොද්‍රිගෝ මහතාටත් හදවතින්ම ස්තුතිවන්ත වෙමි. ඔහුව මට මුණගැසුනේ, මගේ බිරිඳ නිසා බැවින් ඇයටත්, මෙලොව සියලු සැප සම්පත් ලබාදුන් මගේ දෙමාපියන්ටත් හදවතින්ම කෘතවේදී වෙමි. රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය හා එක්වීමෙන් බුදුන් වහන්සේගේ ආශිර්වාදය ලබාගැනීමට හැකිවීම මගේ ජීවිතයේ ලද විශිෂ්ටතම භාග්‍යය යැයි විශ්වාස කරමින් මාගේ සෙප්පෝව අවසන් කරමි.



සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට සහභාගී වූ සුනන්ද මහතා



# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ

## සාරාංශය හා වැදගත් කරුණු

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 5 වන පරිච්ඡේදය, ඖෂධ පැලෑටි උපමාව

'විශ්වාසය හා අවබෝධය' පරිච්ඡේදය අවසන් වූ පසු භාග්‍යවතුන් වහන්සේ මහා කාශ්‍යප තෙරුණ් වහන්සේට 'සාධු සාධු, මහා කාශ්‍යප ස්ථිවරයන් විසින් තථාගතයන් වහන්සේගේ නියම ගුණයන් හොඳින් වර්ණනා කරන ලද්දේය' සේ ප්‍රශංසා කර, ධර්මය හා සියළු සත්වයන් ධර්මාවබෝධය ලබාගැනීම අතර ඇති සබඳතාව පිළිබඳ, 'ඖෂධ පැලෑටි උපමාව' මඟින් පැහැදිලි කර දෙන්නේ මෙම පරිච්ඡේදයෙනි. එම උපමාව මේ ආකාරයෙනි,

### ඖෂධ පැලෑටි උපමාව

'කාශ්‍යපය, ඔබ පවසන ආකාරයටමය. බුදුන් වහන්සේගේ නියම ගුණයන් අපිරිමිතය. තථාගතයන් වහන්සේ ධර්ම රාජ්‍යයකි, අසීමාන්විතව ධර්ම දේශනය තුලින් සෑම මනුෂ්‍යයෙකුවම සමානාත්මතාවයෙන් සලකා, සම්පූර්ණ වශයෙන්ම බුද්ධ ප්‍රඥාව වෙත මඟ පෙන්වන්නේය.' උදාහරණයක් ලෙස මෙම මහ පොළොව මත නොයෙකුත් ශාඛ වර්ගයන් තිබේ. ඒවා කුඩා, මධ්‍යම හා විශාල ප්‍රමාණයෙන් සමෘද්ධිමත් වූ ගස් වැල් හා ඖෂධ පැලෑටි වූ අතර, ගුණයෙන් හා හැඩයෙන්ද එකිනෙකට වෙනස් විය. නමුත්, සියළුම ශාඛයන්ට පොදු වුවේ, වර්ෂාව තුලින් තෙතමනය උරා ගැනීමයි.

අහස පුරා විශාල වැහි වලාකුලක් සමඟ වර්ෂාව පතිත විය. එම වර්ෂාව මහ පොළොවේ සෑම තැනකටම අඩුවක් නැතිව පතිත විය. හැම ශාඛයකටම එක හා සමානව වාගේම හොඳින්ම තෙතමනය ලබා දුනි. කුඩා, මධ්‍යයම හා විශාල ප්‍රමාණයේ තෘණ ගස්ද, කුඩා, මධ්‍යයම හා විශාල ප්‍රමාණයේ ශාඛද එම තෙතමනය තුලින් දළු ලා තවත් හොඳින් වර්ධනය විය.

මේ ආකාරයට එකම වර්ෂාව, එක හා සමාන ආකාරයට පතිත වුවද, තෘණ ගස් හා ශාඛයන්, එක් එක් වර්ගයට වෙනස් වෙයි, හැඩයේ ස්වරූපයද වෙනස් වේ, පිපෙන්නාවූ මල්ද වෙනස් වේ, පලවැලද වෙනස් වේ.

කාශ්‍යපය, තථාගතයන් වහන්සේ අහස පුරා විහිදී තිබෙන මහා වලාකුළ වැනිය. තථාගතයන් වහන්සේ දේශනා කරන්නාවූ ධර්මය, මහ පොළොවට පතිත වූ වර්ෂාව වැන්නේය. සියළු සත්වයන් වන්නේ කුඩා මධ්‍යයම හා විශාල ප්‍රමාණයේ තෘණ ගස් හා ශාකයන්ය.

තථාගතයන් වහන්සේ දේශනා කරන්නේ මේ විශ්වයේ යථාර්තයයි. එහි පදනම එකකි, 'සෑම සියළුදයකම සත්‍යය ස්වරූපය' වේ. තථාගතයන් වහන්සේ දේශනා කරන ධර්මයත්, වර්ෂාව මෙන්ම එකම ස්වරූපයෙන් හා එකම රසයෙන් යුතුය. එහෙත් පුද්ගලයාගෙන් පුද්ගලයාට, ස්වභාවය හා සහජ හැකියාවන් වෙනස් වේ. උපත ලබන පරිසරය, ශාරීරික සෞඛ්‍යය, ජීවත් වන පරිසරය, රැකියාව එකිනෙකට වෙනස් වේ. නමුදු සෑම දෙනාගේම පදනම ලෙස එක හා සමාන බුද්ධ ශක්තිය තිබුණත් ධර්මයේ වර්ෂාව භාර ගන්නා ආකාරයේ වෙනස්වීම් තුලින්, විවිධත්වයක් උපදී.

එකි නෙකාට වෙනස් ආකාරයට වුවද එකිනෙකා ධර්මයේ වර්ෂාව තුලින් තමා උපත ලැබූ පරිසරය හා ස්වභාවය තුලින් වර්ධනය වී, තමන්ට හැකි ආකාරයේ මල්, පලවැල පිදීම සමානාත්මතාවයක් ගෙනදේ. ශාක වර්ගයන් තමා කුඩා, මධ්‍යම හෝ විශාල යන කරුණු නොදනී. එසේ වුවද තමාගේ සහජතාවයන් ටිකෙන් ටික දියුණු කර ගනී.

බුදුන්ගේ දෑසින් බැලූ කල මනුෂ්‍යයන්ද, මෙම තෘණ ගස්,



ශාක හා සමානය. තමාගේ තත්වය කොයි ආකරයේද, මෙම විශ්වය තුල තමාගේ වටිනාකම කොපමණද යන කරුණු ගැන අවබෝධයක් තිබෙන මිනිසුන් නොසිටියි. ඒ ගැන දන්නේ බුදුන් වහන්සේ පමණකි. බුදුන් වහන්සේ, සෑම මනුෂ්‍යයෙකුගේම වත්මන් තත්වය, මානසික ස්වරූපය හොඳින් අවබෝධ කරගෙන, එසේම සෑම මනුෂ්‍යයෙකුගේම පදනම එක හා සමාන බව හොඳින්ම දැන සිටියි.

එම විශිෂ්ඨ වූ ප්‍රඥාව තුලින්, පුද්ගලයාගෙන් පුද්ගලයාට ගැලපෙන ආකාරයට ධර්මය දේශනා කරමින්, සෑම සියළු පුද්ගලයෙකුවම දුකින් මුදවා ගැනීමට කටයුතු කර, මනුෂ්‍යයෙකු ලෙස ගමන් කළ යුතු නිවැරදි මාර්ගය පෙන්වයි. එබැවින්, බුදුන් වහන්සේ විසින් පුද්ගලයාගෙන් පුද්ගලයා දුකින් මුදවා ගන්නා ආකාරය වෙනස් වේ. නමුදු ධර්මයේ පදනම එකක් බැවින්, සියළුම පුද්ගලයන්ට එක හා සමානව ධර්මය ලබාදෙයි. එහෙත් පුද්ගලයාගෙන් පුද්ගලයාට, ස්වභාවය හා සහජ හැකියාවන් වෙනස් වන නිසා, දේශනා කල ධර්මය, දුකින් මුදවා ගත් ආකාරය එකිනෙකට වෙනස් ලෙස පෙනෙවී. එය බුදු දහමේ සුවිශේෂත්වයයි.

## මානුෂීය පදනමේ සමානාත්මතාව හා ස්වරූපයන්ගේ වෙනස්බව

මෙහි පෙන්වා ඇති වැදගත්ම කරුණ නම්, 'ධර්මානුකූල දුකින් මුදවා ගැනීම, හැඩයන්ගෙන් වෙනස් වුවද, එක හා සමාන' වේ. ඉහත උදාහරණය තුලින්, 'මනුෂ්‍යයන්ගේ පදනමේ තිබෙන සමානකම, හැඩයන්හි තිබෙන වෙනස හා එම කරුණු 2කම හොඳින් අවබෝධ කර ගැනීම නිවැරදි ප්‍රඥාව වේ' ලෙස ධර්මය හොඳින් උකහා ගත යුතුය.

මානුෂීය පදනමේ තිබෙන සමානාත්මතාවය පමණක් ගැන සිතන්නේ නම්, වනගත වූ තාපස කෙනෙකු මෙන් වී, ජීවිතයට මුහුණ දී ලෞකික ජීවිතයෙන් ඈත්වූවද, එදිනෙද ජීවිතය ගැන අවබෝධයක් නොමැති වන්නේය.

එසේම ස්වරූපයන්හි තිබෙන වෙනස්බව ගැන පමණක් සිතන්නේ නම්, අධි මානය හා හීන මානයට භාජනය වී (උඩඟුකම, අහංකාරබව, නිග්‍රහ කිරීම, ඉරිසියාව, ද්වේෂය, විරුද්ධත්වය) තෘෂ්ණාව තුලින් ගැටුම් හා දුක් පීඩා සීමාවක් නොමැතිව ඇතිවී මානුෂීය සමාජය තුල සහනයක් නොමැතිවේ.

මනුෂ්‍යයන් එකිනෙකාගේ ස්වරූපය එකිනෙකට වෙනස් වූවත්, සෑම මනුෂ්‍යයෙකුගේම පදනම බුදුන්



වහන්සේ හා එකට බැඳී තිබේ. එම කරුණ නියමාකාරයෙන් අවබෝධ කර ගැනීම තුලින් තමා හා අන්‍යයන්ගේ ජීවිත නිවැරදි ආකාරයට ගත කිරීමට හැකි බවයි අපිට මෙම පරිච්ඡේදය තුලින් කියාදෙන්නේ.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
# 6 වන පරිච්ඡේදය, විවරණ ලබා දීම

මෙම පරිච්ඡේදයේදී, 'විශ්වාසය හා අවබෝධය යන 4 වන පරිච්ඡේදයේ' ලැබූ අත්දැකීම් පාදක කරගෙන නියමාකරයෙන් ධර්මය අවබෝධ කර ගත් මහා කාශ්‍යපප, මහා මුගලන්, මහා සුභූති, මහා කත්‍යාන යන සිවු තෙරුණ් වහන්සේලාට විවරණ ලබා දුන්හ. විවරණ ලබාදීම යනු '2 පරිච්ඡේදය වන උපාය කෞෂල්‍යයේ' දේශනා කළ, 'සෑම කෙනෙකුටම අනිවාර්යයෙන්ම ධර්මාවබෝධය සාක්ෂාත් කරගෙන, බුදු බවට පත් වීමට හැකිය' ලෙස ආරක්ෂණයේ සහතික ලබා දීමය.



## විවරණය සඳහා කොන්දේසි ඇත

මෙම ආරක්ෂණයේ සහතිකය ලබා දීම කොන්දේසි ඇත. එහි, 'මේ ආකාරයට ධර්ම පුහුණුවෙන් පසු.....' ලෙස සඳහන් වේ. විවරණ ලැබීම යනු ධර්මාවබෝධය ලබා ගත හැකි විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමේ අවසර පත පමණක්ම වේ, උපාධි පත්‍ර ය නොවේ. ඒ වෙනුවෙන් හොඳින් අධ්‍යාපනය ලැබීම අත්‍යාවශය. 'උපමා කතාවක් වන 3 වන පරිච්ඡේදයේ' සඳහන් පරිදි 'තම ශක්තිය', හා 'අන්‍යන්ගේ ශක්තිය' වෙනස් ආකාරයකට මෙහි සඳහන් වේ.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P68-P74)

# Director’s Column

## සතුට සොම්නස ළඟාකරදෙන කෙනෙකු බවට පත්වෙමු

අපේ සංවිධානයේ සංවත්සරික උත්සවය සමරණ මාර්තු මාසයද උදාවිය. 100 වෙනි සංවත්සරයට පියනගන අප සංවිධානයේ 81 වෙනි වසර එයින් ඇරඹුනි.

මේ වසර ආරම්භයේදී නිච්කෝ නිවානෝ තුමාගේ ධර්ම පණිවුඩයේ ‘තමාගේ දියුණුව ක්‍රමයෙන් ඇතිකර ගනිමු’ ලෙස දැක්වුනි. තවද නව වසර ආරම්භක උත්සවයේදී දෝගෙන් සෙන් ගුරුතුමාගේ වදනක් උපුටා දක්වමින් නිවානෝ ප්‍රධානී තුමා විග්‍රහ කර සිටියේ, තමන් හා අන්‍යන් ලෙස බේදීමක් නොමැත, අප සැමගේම පදනම එකකි, එකට බැඳී පවතින බවය.

මේ මස ධර්ම පණිවුඩයේදී, විවිධාර්ථ සූත්‍රයේ දශ පුණ්‍යයෝ පරිච්ඡේදයේ සූත්‍ර කොටසක් ගෙන හැර දක්වමින් අප ‘බුද්ධ පුත්‍රයෝ’ වන බව අවබෝධ කරගෙන, අන් අය ගැන නිතරම සිතමින් කටයුතු කරන පුද්ගලයන්, තමාගේත් අන්‍යයන්ගේත් සතුට ළඟාකර ගනිමින්, දුකින් මුදවා ගැනීමට කටයුතු කරන කෙනෙකු බවට පත්වෙමු.... ලෙස පෙන්වා දුන්හ.

‘එක් කෙනෙකු හෝ වැඩි පිරිසකට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට අනුකූල ජීවන ගමන් මඟ පෙන්වා දී, නියම සතුට තමාගේ බවට පත් කරගත යුතුය’ ලෙස නිර්මාතෘ තුමා අප සංවිධානය ස්ථපිත කිරීමේදී කල ප්‍රාර්ථනය, අපගේ ජීවිතයේ ප්‍රාර්ථනය බවට පත්කර ගෙන මේ මාසයේදීත් ධර්ම ව්‍යාප්තියේ යෙදෙමු.



රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movememt




**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224
*e-mail:* living.the.lotus.rk-international@kosei-kai.or.jp

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street, Suite #1, Los Angeles, CA 90033, U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
*e-mail:* rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, U.S.A
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel:* (727) 560-2927 *e-mail:* rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://rkchi.org/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel:* 1-405-943-5030 *Fax:* 1-405-943-5303
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377 *Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420,
Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094,
West Bengal, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur, Kathmandu,
Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel & Fax:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station:
Mirshari, District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar,
Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax:* 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Branches under the Headquarters**
**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax:* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**